**ශීර්ෂය 158 - රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය ශීර්ෂය 158 දරන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසැඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 158 - රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 09 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසැඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසැඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත.

මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත නොවීම** | **නිරීක්ෂණය ඇතුලත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127(1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලසුම් කළ යුතු වීම | 1. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම. | 2.2 |
| | | 2. අධි ප්‍රතිපාදනය | 2.4 |
| | | 3. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම. | 2.1.2 (ආ) |
| | | 4. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. | 2.1.2(ආ) |
| | | 5. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.5 |
| | | 6. ගොඩනැගිලි කුලියට ගැනීමේ අඩුපාඩු | 2.3 (ආ) |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.3(අ) |
| | | 2. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම. | 2.3(ඇ) |
| 127 (4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම. | 2.1.3(අ)(ආ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 2.1 කාර්යසාධනය

---

#### 2.1.1 සැලැසුම් කිරීම

---

අමාත්‍යාංශය විසින් පිළියෙළ කර තිබූ 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් බැංකු මූල්‍ය, රක්ෂණ හා වැවිලි කර්මාන්ත අංශයන්ට අදාළ අපේක්ෂිත අරමුණු ඉටු වූවාද යන්න පරීක්ෂා කිරීමට හැකි ආකාරයට ප්‍රගති වාර්තා සකස් කර නොතිබුණි.

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

---

රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් රු.මිලියන 12 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේම ක්‍රියාකාරී සැලැස්මටද එයට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් කර තිබූ නමුත් මේ සම්බන්ධ කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

(ආ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

---

(i) පාඩු ලබන ව්‍යවසායන් හඳුනාගෙන ඒවා සමස්ථ ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දිය හැකි අයුරින් ප්‍රතිව්‍යුහකරණයට අවශ්‍ය ක්‍රමවේද හඳුනා ගැනීම හා අවශ්‍ය මඟපෙන්වීම් ලබා දීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු වී තිබුණි. ඒ අනුව එම අරමුණු ඉටුකර ගැනීම සඳහා වැවිලි සමාගම් 05 ක ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙල අනුව වගා කළ නොහැකි ඉඩම් පැවති සමාගම් “රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරීත්වය (PP) ” ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තාව 2018 ජනවාරි 22 දින අමාත්‍ය මණ්ඩලයට යොමුකර තිබුණි. එහෙත් මේ දක්වා ඊට අනුමැතිය ලබාදී නොතිබුණ ද මෙම සමාගම් සඳහා 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පුනරාවර්තන වියදම් වෙනුවෙන් එකතුව රු.මිලියන 214.10 ක් හා සංවර්ධන වැඩ වෙනුවෙන් රු. මිලියන 2,906.63 ක් රාජ්‍ය අයවැය මඟින් වැය කර තිබුණි.

(ii) අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්ත 02 ක් සඳහා ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙල යටතේ සමාගමක් සතු ඉඩම නීත්‍යානුකූලව රජයට පවරාගෙන නව ස්ථානයක යළි පිහිටුවීමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍ය මණ්ඩල අනු කමිටුව වෙත යොමුකර ඇතත් 2018 ජූනි මස වන විටත් එම ගැටළුව විසඳා නොතිබුණි. අනෙක් කර්මාන්තය වන පිහන් සංස්ථාව සම්බන්ධයෙන් සිදුවී ඇති අක්‍රමිකතා, විනය පරීක්ෂණ හා සම්පත් නිවැරදිව යොදා නොගැනීම පිළිබඳව පරීක්ෂා කිරීමට 2017 වර්ෂයේ පත්කල ත්‍රිපුද්ගල කමිටුවේ වාර්තාද 2018 ජූනි මස දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

### 2.1.3 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තා 46 ක් 2018 අගෝස්තු 03 දින වන විට අමාත්‍යාංශයට භාරදී ඇතත් වාර්තා 9 ක් පමණක් සභාගත කර තිබුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විගණනය සඳහා ගිණුම් ප්‍රකාශ හා වාර්ෂික වාර්තා පිළියෙල කරවීම අමාත්‍යාංශයේ එක් අරමුණක් වුවද වැවිලි සමාගම් 05 ක, රාජ්‍ය බැංකු 02 ක හා කර්මාන්ත 02 ක 2017 වර්ෂයේ වාර්ෂික වාර්තා සකස් කර නොතිබුණි. ඉන් සමාගම් 02 ක් වාර්ෂික වාර්තා 2013 වර්ෂයේ සිට සකස් කර නොතිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2:1 (ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06කට වැඩි නොවන කාලයක් තුළදි යාවත්කාලින කර නොතිබීම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු මඟින් සිදු කර ඇති රු.මිලියන 44 ක ප්‍රසම්පාදනයන් ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය අනුව නියමිත ආකෘතිය ප්‍රකාරව භාණ්ඩ, සේවා, වැඩ වෙනුවෙන් සියළු ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන සැළැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 2.3 වත්කම් කළමනාකරණය

---------------------------

(අ) **ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම**

------------------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

(ආ) **ගොඩනැගිලි කුලියට ගැනීමේ අඩුපාඩු**

-----------------------------------------

අමාත්‍යාංශය විසින් වාර්ෂිකව රු. මිලියන 94.81 ක කුලියක් මත ලබාගත් ගොඩනැගිල්ලක කාර්යාලය පවත්වාගෙන යනු ලබන අතර එම ගොඩනැගිල්ලේ සමස්ථ වාහන ගාල් කිරීමේ ධාරිතාවය වාහන 22 කට පමණක් සීමා වී තිබූ හෙයින් අමාත්‍යාංශය සතු වාහන 32 ක් ගාල් කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබාගෙන නොතිබුණි.

(ඇ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3:1 ඡේදය ප්‍රකාරව 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තාව 2018 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 ජූලි 31 වන විටත් සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) 2016 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්ථාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.4 කාර්යභාරයන් ඉටුකිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 3 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2015 | පුනරාවර්තන | 24.93 | 17.60 | 07.33 | 29.40 |
| | මූලධන | 1,181.96 | 1,172.30 | 9.66 | 0.82 |
| | **එකතුව** | **1,206.89** | **1,189.90** | **16.99** | **1.41** |
| 2016 | පුනරාවර්තන | 288.78 | 267.18 | 21.60 | 7.47 |
| | මූලධන | 847.01 | 820.56 | 26.45 | 3.12 |
| | **එකතුව** | **1,138.79** | **1,087.74** | **48.05** | **4.22** |
| 2017 | පුනරාවර්තන | 295.05 | 279.11 | 15.94 | 5.42 |
| | මූලධන | 9,668.98 | 1,270.19 | 8,398.79 | 86.86 |
| | **එකතුව** | **9,964.03** | **1,549.30** | **8,414.73** | **84.45** |

සමාලෝචිත සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

**අධි ප්‍රතිපාදනය**

(i) නිල නිවස අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පරිපූරක ඇස්තමේන්තු 02 ක් මගින් රු. මිලියන 65.83ක ප්‍රතිපාදනයක් සලසාගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 51.5 ක් ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.මිලියන 12 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(iii) වැය විෂයයන් 10 ක් සඳහා එකතුව රු.මිලියන 883 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 1,222 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක සිට සියයට 70 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ඨය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |

## 2.6 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

අමාත්‍යාංශයේ සඳහන් කාරයභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 71 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 15 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 43 | 30 | 13 |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | ප්‍රාථමික මට්ටම | 31 | 27 | 04 |
| (v) | වෙනත්(අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02<br>----- | 02<br>------ | -<br>------ |
| | **එකතුව** | **103** | **77** | **26** |

ඉහත කාර්ය මණ්ඩලයට අමතරව, සමාලෝචිත වර්ෂයේදී අමාත්‍ය කාර්ය මණ්ඩලයට අයත් 42 දෙදෙනෙකු අමාත්‍යාංශයේ සේවා නියුක්ත විය.